# මාධ්‍ය නිවේදනය
# 2016 වර්ෂයේ පළමු කාර්තුව සඳහා
## වියදම් ප්‍රවේශය යටතේ
# ශ්‍රී ලංකා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


……………………………………………………………………………………………

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 පළමුවන කාර්තුව සඳහා පවත්නා මිල සහ ස්ථාවර (2010) මිල යටතේ වියදම් ප්‍රවේශයට අනුව ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශකයන් නිකුත් කොට ඇත.

නිෂ්පාදන ප්‍රවේශයට අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2016 වර්ෂයේ පළමු කාර්තුව (ජනවාරි සිට මාර්තු දක්වා) සඳහා පවත්නා මිල යටතේ රු. මිලියන 2,979,745 ක් ලෙස ද ස්ථාවර(2010) මිල යටතේ එය රුපියල් මිලියන 2,088,024 ක් ලෙසද ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර දැනටමත් ප්‍රකාශයට පත්කොට ඇත. ඒ අනුව 2016 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ඇස්තමේන්තුගත ආර්ථික වර්ධන වේගය සියයට 5.5 ක් ලෙස ද වාර්තා වී ඇත. මෙම දර්ශකයන් අදාල කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය වියදම් ප්‍රවේශයෙන් ගණනය කිරීමේ දී ද නොවෙනස්ව පවතින නමුත් දළ දේශීය නිෂ්පාදිතය සෑදුම්ලත් සංරචක එම ප්‍රවේශ දෙකෙහි දී එකිනෙකට වෙනස් වේ.

වියදම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රධාන සංරචකයන් වන “අවසාන පරිභෝජන වියදම”, “දළ ප්‍රාග්ධන සම්පාදනය සහ භාණ්ඩ” හා “සේවා ශුද්ධ අපනයන” 2016 වර්ෂයේ පළමු කාර්තුවේ පවත්නා මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා පිළිවෙලින් සියයට 76.2, සියයට 29.1 සහ සියයට -5.3 කින් දායක වී ඇත.

අවසාන පරිභෝජන වියදම තුළ ඇතුලත් “කුටුම්භ පරිභෝජන වියදම” සියයට 3.2 කින් සහ “රජයේ පරිභෝජන වියදම” සියයට 2.7 කින් වර්ධනය වි තිබේ. රජයේ පරිභෝජන වියදම තුළ ඇතුලත් “පුද්ගල පරිභෝජන වියදම” සියයට 8.9 ක ඉහළ වර්ධනයක් වාර්තා කළද “සාමූහික පරිභෝජන වියදම” ස්ථාවර(2010) මිල ගණන් යටතේ 2015 වර්ෂයේ පළමු කාර්තුවේ පැවති රුපියල් මිලියන

96,471 ට සාපේක්ෂව සියයට සෘන 0.1 ක අඩුවීමක් වාර්තා කරමින් 2016 වර්ෂයේ පළමු කාර්තුවේ දී රුපියල් මිලියන 96,365 ක් වී තිබේ .

2015 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව 2016 වර්ෂයේ පළමු කාර්තුව තුලදී වියදම් ප්‍රවේශය යටතේ ස්ථාවර මිල (2010) අනුව ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයට "දළ ප්‍රාග්ධන සම්පාදනය" දක්වන දායකත්වය රුපියල් මිලියන 558,832 සිට රුපියල් මිලියන 620,968 දක්වා සියයට 11.1 කින් වර්ධනය වී තිබේ. අදාල කාලය තුළ තොග වෙනස් වීම් සියයට 142.7 ක ඉතා ඉහළ වර්ධනයක් ද වාර්තා කර තිබේ.

"භාණ්ඩ හා සේවා අපනයන" සහ "භාණ්ඩ හා සේවා ආනයන" අතර වෙනස ලෙස ගණනය කෙරෙන "භාණ්ඩ හා සේවා ශුද්ධ අපනයන" තුළ භාණ්ඩ හා සේවා අපනයන 2015 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව සියයට 1.8 ක වර්ධනයක් අත්කර ගනිමින් කරමින් රුපියල් මිලියන 413,827 ක් දක්වා ළඟා වී ඇත. එසේ ම අදාල කාලය තුළ "භාණ්ඩ හා සේවා ආනයන" සියයට 1.9 කින් වර්ධනය වී ඇත.

2016 වර්ෂයේ පළමු වන කාර්තුව සඳහා වියදම් ප්‍රවේශයෙන් ඇස්තමේන්තු කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු www.statistics.gov.lk දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දන්වා සිටී.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව